
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வடமத்திய மாகாணம
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

# 6 ශ්‍රේණිය - ගණිතය

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2025

## ලකුණු දීමේ පටිපාටිය



**(උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි)**

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
## Department of Education – North Central Province

ශ්‍රේණිය - 6 | දෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය : පැය 2 යි

විෂයය :- ගණිතය


පාසලේ නම :- ..........

ඇතුළත්වීමේ අංකය :- ..........

### I කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. (පිළිතුරු ලබා ගත් ආකාරය දැක්වීම අනිවාර්ය වේ)

01. පහත දැක්වෙන රූපයේ වෘත්ත හතර තුළම පිහිටි ලක්ෂයට අදාල අක්ෂරය තෝරා ඊට යටින් ඉරක් අඳින්න.




A    B    <u>C</u>    D

(2)

02. $\frac{3}{5}$ ට තුල්‍ය භාග දෙකක් ලියන්න.


**එක් පිළිතුරකට 1 බැගින්**

**6/10 = 30/50 වැනි සුදුසු නිවැරදි පිළිතුරු දෙකකට**

(1) + (1)

03. දක්වා ඇති සංඛ්‍යා රේඛාව මත A = 3 හා B = -2 යන සංඛ්‍යා නිවැරදිව නිරූපණය කරන්න.

**එක් පිළිතුරකට 1 බැගින්**




(1) + (1)

04. 3, -5, 0 යන සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

**-5, 0, 3**

(2)

05. නිවැරදි පිළිතුර යොදා හිස් තැන් පුරවන්න.

**එක් පිළිතුරකට 1 බැගින්**


(*a*) තලයක තිරස් බව දැන ගැනීම සඳහා **ලෙවල් බටය / ස්පිරිතු ලෙවලය** භාවිතා කරයි.

(1) + (1)

(*b*) තලයක සිරස් බව දැන ගැනීම සඳහා **ලඹය** භාවිතා කරයි.

**හෝ සුදුසු නිවැරදි වෙනත් පිළිතුරු**

06. පහත දැක්වෙන සෘජුකෝණාස්‍රාකාර කාඩ්බෝඩ් කැබැල්ලේ පරිමිතිය සොයන්න.




| | m | cm |
|---|---|---|
| | 2 | 60 |
| | 2 | 60 |
| | 1 | 72 |
| + | 1 | 72 |
| | **8** | **64** |

**ක්‍රමය දැක්වීමට - 1 පිළිතුරට - 1**

(1) + (1)

07. දක්වා ඇති දශම සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

2.75 = **දෙකයි දශම හතයි පහයි**

(2)

08. පහත දැක්වෙන සංඛ්‍යාව 2 න් , 5 න් සහ 10න් ඉතිරි නැතිව බෙදේ. මෙම සංඛ්‍යාවේ එකස්ථානයට යෙදිය හැකි ඉලක්කම හිස්කොටුව තුල ලියන්න.

3487 **0**

(2)

09. ඉනුකි ලඟ ඇති මුදල ආසන්න දහයේ ගුණාකාරයට වටැයූ විට රු. 50 ක් බව පවසයි. ඇය ලඟ තිබිය හැකි,

උපරිම මුදල කීයද? **රු. 54**    අවම මුදල කීයද? **රු. 45**

**එක් පිළිතුරකට 1 බැගින්**

(1) + (1)

10. 20 හි සාධකයක් නොවන සංඛ්‍යාව තෝරා යටින් ඉරක් අඳින්න.

1    <u>3</u>    5    10

(2)

11. -4 ත් 3 ත් අතර ඇති ධන නිඛිල සියල්ල ලියන්න.

**1, 2** (2)

12. "තුන් බිලියන හාරසිය මිලියන පනස් හත" සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න.

**3 400 000 057**

**නිවැරදිව සංඛ්‍යාව ලියා ඇත්නම් 01 යි**
**ලියා ඇති සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා ඇති නම් 01**

(1) + (1)

13. රූපවාහිනී වැඩසටහනක් 17:30 ට ආරම්භ වී 17:55 ට නිම විය. වැඩසටහන විකාශනය වූ කාලය සොයන්න.


**17:55 - 17:30 = 00.25 මිනිත්තු 25 යි**

(1) + (1)

14. 29 සිට 41 තෙක් පහේ ගුණාකාර සියල්ලම ලියන්න.

**30, 35, 40** (2)

15. දක්වා ඇත්තේ කැඩුන සෙන්ටි මීටර් කෝදුවකින් ශාක පත්‍රයක දිග මැනීමට ගන්නා උත්සහයකි. දක්වා ඇති තොරතුරු අනුව ශාක පත්‍රයේ දිග කොපමණ ද ?



**14 - 8 = 6 cm**

**ක්‍රමය දැක්වීමට - 1 පිළිතුරට - 1**

(1) + (1)

16. 27.72 + 8.9 = ................ අගය සොයන්න.

$$\begin{array}{r} 27.72 \\ +\ 8.9 \\ \hline 36.62 \\ \hline \end{array}$$

**ක්‍රමය දැක්වීමට - 1 පිළිතුරට - 1**

(1) + (1)

17. සදෙව්ගේ උපන් දිනය 2014 වර්ෂයේ මැයි මස තුන් වෙනිදායි. මෙම දිනය සම්මත ආකාරයට ලියන්න.

**2014-05-03** (2)

18. 7 890 සංඛ්‍යාවේ 8 පිහිටන ස්ථානයේ ස්ථානීය අගය හා එමගින් නිරූපිත අගය ලියන්න.

**එක් පිළිතුරකට 1 බැගින්**

8 පිහිටි ස්ථානයේ ස්ථානීය අගය : ...**සියස්ථානය**...................   8 න් නිරූපිත අගය : ...**800**........

(1) + (1)

19. <, =, > යන සංකේතවලින් නිවැරදි සංකේතය තෝරා හිස්තැන් පුරවන්න.

3.2 .....=..... 3.20 (2)

20. හිස් තැන් පුරවන්න.

3250m = .......**3**km .......**250**m (2)

(ල. 2×20 = 40)

40

ඇතුලත්වීමේ අංකය: ........................................

## II කොටස
## පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න

01.(*a*) පහත දක්වා ඇත්තේ 6 ශ්‍රේණියේ ගණිතය පාඩමක ක්‍රියාකාරකමකි. එහි එකම වර්ගයේ පබළු අඩංගු භාජනයක කළු පබළු 50 ක් හා සුදු පබළු 50 ක් බැගින් අඩංගු වේ.

i. කළු පබළු යොදාගෙන ඒවා සමචතුරස්‍රාකාරව පිහිටන පරිදි එනම්, පේළි හා තීර ගණන සමාන වන පරිදි සකස්කර ගැනීමට උපදෙස් ලැබුණි. මුල් පියවර දෙක පහත දක්වා ඇත. ඉදිරි පියවර දෙක සම්පූර්ණ කරන්න. ඒ ඒ පියවර සඳහා යොදාගෙන ඇති පබළු ගණනද ඊට යටින් ලියන්න.

**පළමු පියවර** **දෙවන පියවර** **තෙවන පියවර** **හතරවන පියවර**

**නිවැරදිව රටාව නිරූපණය කිරීමට 01**
**සංඛ්‍යා නිවැරදිව දැක්වීමට 01**



**භාවිතා කර ඇති පබළු ගණන** 1 4 ..**9**.. ..**16**.. ( ල. 02 )

ii. ඉහත පබළු මඟින් නිරූපණය වූ සංඛ්‍යා කුමන නමකින් හැඳින්විය හැකි ද ? ..**සමචතුරස්‍ර සංඛ්‍යා**..
( ල. 01 )

iii. සුදු පබළු යොදාගෙන ඒවා ත්‍රිකෝණාකාරව පිහිටන පරිදි සකස්කර ගැනීමට උපදෙස් ලැබුණි. මුල් පියවර දෙක පහත දක්වා ඇත. ඉදිරි පියවර තුන සම්පූර්ණ කරන්න. ඒ ඒ පියවර සඳහා යොදාගෙන ඇති පබළු ගණන ද ඊට යටින් ලියන්න.

**පළමු පියවර** **දෙවන පියවර** **තෙවන පියවර** **හතරවන පියවර** **පස්වන පියවර**

**නිවැරදිව රටාව නිරූපණය කිරීමට 02**
**සංඛ්‍යා නිවැරදිව දැක්වීමට 01**



**භාවිතා කර ඇති පබළු ගණන** 1 3 ..**6**.. ..**10**.. ..**15**.. ( ල. 03 )

iv. ඉහත පබළු මඟින් නිරූපණය වූ සංඛ්‍යා කුමන නමකින් හැඳින්විය හැකි ද ? ..**ත්‍රිකෝණ සංඛ්‍යා**..
( ල. 01 )

v. ඉහත ත්‍රිකෝණාකාරව සකස් කළ පියවරවල ඇති පබළු සංඛ්‍යා යොදාගෙන පහත හිස්තැන් පුරවන්න.


(*a*). ..**3**... ප්‍රථමක සංඛ්‍යාවක් වේ.

(*b*). ..**6**... සංයුක්ත සංඛ්‍යාවක් වේ. **හෝ 10 හෝ 15**

(*c*). ...**1**... ප්‍රථමක සංඛ්‍යාවක් හෝ සංයුක්ත සංඛ්‍යාවක් නොවේ. ( ල. 03 )

**එක් පිළිතුරකට 1 බැගින්**

(*b*) ගණිතය ක්‍රියාකාරකමක් සඳහා පහත දක්වා ඇති ආකාරයේ පතරම් දෙකක් ලබා දී තිබුණි.



i. මෙම පතරමක් භාවිතයෙන් සෑදිය හැකි ඝනවස්තුවේ නම ලියන්න.
**ඝනකය**..................................
( ල. 02 )


ii. ලබා දී ඇති පරතම් දෙක භාවියෙන් ඝනවස්තු දෙකක් සදා ඒවායේ මුහුණත් දෙකක් එකමත එක සිටින සේ අලවන ලදි. එවිට සෑදුන ඝන වස්තුවේ,

නම කුමක්ද ? ..**ඝනකාභය**..................
මුහුණත් ගණන කීයද ? ..**6**..................
දාර ගණන කීයද ? ..**12**..................
ශීර්ෂ ගණන කීයද ? ..**8**..................

**එක් පිළිතුරකට 1 බැගින්** ( ල. 04 )

16

02. (*a*) පහත දක්වෙන්නේ පන්ති කාමරයේ මේසයක් මත දෑත් දෙපසට විහිදුවා සිටින රශ්මිල් ය. ඔහු මේසය මත නැඟී උදෑසන හිරු පායා ඒම නරඹයි.




i. ඔහු මුහුණලා සිටින්නේ කුමන දිශාවට ද ? ....**නැගෙනහිර දිශාවට**.................................................. ( ල. 01 )

ii. ඔහුට කුමන දිශාවෙන් සිංහල හෝඩිය දැක්වෙන පුවරුව දිස්වේ ද? ....**දකුණු දිශාවෙන්**.................. ( ල. 01 )

හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා ලියන්න.


iii. ඉංග්‍රීසි හෝඩියට දකුණු දිශාවෙන් ....**රශ්මිල්**.......... (රශ්මිල් / ඉර ) හා **සිංහල හෝඩිය** **දැක්වෙන පුවරුව**...... (පින්තූර රාමුව / සිංහල හෝඩිය දැක්වෙන පුවරුව) ඇත. ( ල. 02 )

iv. රශ්මිල්ට .................**සිරස්** ව (සිරස් / තිරස් ) ..................**ඉහළින්**.. (ඉහළින් / පහළින්) විදුලි පංකාව ඇත. ( ල. 02 )

(b). ඉහත පන්ති කාමරය තුල ඩෙස් 12 ක් ඇත.

i. 12 හි සියළු සාධක ලියන්න. ....**1, 2, 3, 4, 6, 12**.......... සාධක 02 කට ලකුණු 1 බැගිනි ( ල. 03 )

ii. මෙම ඩෙස් 12 පන්තිය තුළ ඇසිරිය හැකි ආකාරයක් පහත පෙන්වා ඇත. එම ආකාරය හැර ඩෙස් 12 ඇසිරිය හැකි තවත් ආකාර දෙකක් පෙන්වන්න. (එක් එක් පේළියකට සමාන පුටු ප්‍රමාණයක් තිබිය යුතුයි)





නිවැරදි නිරූපණයකට 01 බැගිනි

**පේළි 6 යි තීර 2 යි   පේළි 4 යි තීර 3 යි   පේළි 3 යි තීර 4 යි   හෝ සුදුසු පිළිතුරක්** ( ල. 02 )

11

03. (*a*) පහත රූප සටහන් ගණිත ක්‍රියාකාරකමක් සඳහා A හා B කණ්ඩායම් දෙකකට ලබා දෙන ලදි. එම රූප සටහන් හොඳින් අධ්‍යයනය කර ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. A කණ්ඩායමට ලබා දී ඇති රූප සටහනේ පහත දක්වා ඇති සංවෘත සරල රේඛීය තල රූප දැක්වෙන අංකය හඳුනාගෙන අදාල අංකය තිත් ඉර මත ලියන්න.

ත්‍රිකෝණය දැක්වෙන අංකය ........1........

සමාන්තරාස්‍රය දැක්වෙන අංකය ........3........

රොම්බසය දැක්වෙන අංකය ........2........

ත්‍රපීසියම දැක්වෙන අංකය ........4........ **නිවැරදි එක් පිළිතුරකට 1 ක් ලකුණ බැගිනි** ( ල. 04 )

ii. B කණ්ඩායමට ලබා දී ඇති රූප සටහනේ දක්වා ඇති කෝණවල ප්‍රමාණය අනුව එම කෝණවලට සුදුසු නම වරහන්තුලින් තෝරා ලියන්න.

(සුළු කෝණයකි / මහා කෝණයකි / පරාවර්ත කෝණයකි / සරල කෝණයකි / සෘජු කෝණයකි)

*a* අක්ෂරයෙන් දැක්වෙන්නේ ........සෘජු කෝණයකි........

*b* අක්ෂරයෙන් දැක්වෙන්නේ ........පරාවර්ත කෝණයකි........

*c* අක්ෂරයෙන් දැක්වෙන්නේ ........සරල කෝණයකි........

*d* අක්ෂරයෙන් දැක්වෙන්නේ ........සුළු කෝණයකි........

*e* අක්ෂරයෙන් දැක්වෙන්නේ ........මහා කෝණයකි........ ( ල. 05 )

**නිවැරදි එක් පිළිතුරකට 1 ක් ලකුණ බැගිනි**

iii. ඔබ කැමති විවෘත්ත සරල රේඛීය තල රූපයක් අඳින්න.

**සුදුසු නිවැරදි රූපයක්**

( ල. 02 )

11

04. (*a*) පහත කොටුව තුළ ඇති භාගවලින් ගැලපෙන භාගය තෝරා හිස්තැන මත ලියන්න.

$$\frac{2}{5}, \frac{3}{4}, \frac{1}{7}, \frac{3}{8}, \frac{4}{7}, \frac{1}{2}$$

i. "**බාගය**" නිරූපණය කරන භාග සංඛ්‍යාව කුමක් ද? **1/2** ① 

ii. ඒකක භාග දෙකක් තෝරා ලියන්න. **1/7 , 1/2** ①

iii. ලවය ඉරට්ට සංඛ්‍යාවක් වන තත්‍ය භාග දෙකක් ලියන්න. **2/5 , 4/7** ① ( ල. 03 )

(*b*) <, >, = යන ලකුණු යොදා හිස් තැන් පුරවන්න.

i. $\frac{4}{5}$ **>** $\frac{3}{5}$

ii. $\frac{7}{8}$ **>** $\frac{7}{9}$

iii. $\frac{3}{4}$ **>** $\frac{5}{8}$

$\frac{6}{8} > \frac{5}{8}$

iv. $\frac{2}{3}$ **=** $\frac{10}{15}$

$\frac{10}{15} = \frac{10}{15}$

නිවැරදි එක් පිළිතුරකට 1 ක් ලකුණු බැගිනි ( ල. 04 )

(*c*) සුළු කරන්න.

i. $\frac{2}{7} + \frac{3}{14}$

$= \frac{4}{14} + \frac{3}{14}$

$= \frac{7}{14} = \frac{1}{2}$

පොදු හරයක් ලබා ගැනීමට 01
අවසන් පිළිතුරට 01

ii. $\frac{3}{5} - \frac{1}{2}$

$= \frac{6}{10} - \frac{5}{10}$

$= \frac{1}{10}$

පොදු හරයක් ලබා ගැනීමට 01
අවසන් පිළිතුරට 01

( ල. 04 )

11

05. (*a*) හිස්තැන් පුරවන්න.

i. මිනිත්තු 180 = පැය **3**

ii. පැය 3 යි මිනිත්තු 20 යි = මිනිත්තු **200**

iii. තත්පර 280 යි = මිනිත්තු **4** තත්පර **40** ( ල. 03 )

නිවැරදි එක් පිළිතුරකට 1 ක් ලකුණු බැගිනි

(*b*) හිස්තැන් පුරවන්න.

| පැය 12 ක්‍රමය | සම්මත ක්‍රමය |
|---|---|
| මධ්‍යම රාත්‍රී 12 යි | **00:00** |
| **පෙ.ව. 7.30** | 07:30 |
| **මධ්‍යහ්න 12 හෝ දහවල් 12** | 12:00 |
| ප. ව. 4.30 | **16:30** |

( ල. 04 )

නිවැරදි එක් පිළිතුරකට 1 ක් ලකුණු බැගිනි

(*c*) සුළු කරන්න.

| මිනිත්තු | තත්පර |
|---|---|
| 20 | 20 |
| + 14 | 50 |
| **35** | **10** |

| පැය | මිනිත්තු |
|---|---|
| 20 | 20 |
| -14 | 50 |
| **5** | **30** |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගිනි

( ල. 04 )

11


06. (*a*) අපට එදිනෙදා ජීවිතයේ දී විවිධ වූ ද්‍රව ප්‍රමාණ මැනීමට සිදු වේ.

i. පහත ද්‍රව ප්‍රමාණ මැනීමට වඩාත් සුදුසු ඒකකය කුමක්දැයි හිස්තැන මත ලියන්න.

- ❖ ළදරුවෙකුට වරකට ලබා දෙන බෙහෙත් දියර ප්‍රමාණය ...**ml**.......**මිලි ලීටර**..
- ❖ මිනිසෙකු දිනකට පානය කරන ජල ප්‍රමාණය ...**l**..........**ලීටර**.......
- ❖ බස් රථයකට වරකට යොදන ඉන්ධන ප්‍රමාණය ...**l**..........**ලීටර**.......

**නිවැරදි එක් පිළිතුරකට 1 ක් ලකුණු බැගිනි** ( ල. 03 )


ii. පහත දැක්වෙන භාජන 3 හි ඇති මුළු ද්‍රව පරිමාව ලීටර හා මිලි ලීටර වලින් සොයන්න.




| *l* | *ml* |
|---|---|
| | 50 |
| | 700 |
| + 1 | 250 |
| 2 | 000 |

**ක්‍රමයට 01 යි**
**පිළිතුරට 01 යි** ( ල. 02 )

iii. පහත භාජනයේ ඇති ද්‍රව ප්‍රමාණය 100 ml බව නිසිනු පවසයි. එම භාජනයට පිරවිය හැකි උපරිම ද්‍රව පරිමාව නිමානය කරන්න.

100 ml {


**100×4 = 400 ml**...........

**ක්‍රමයට 01 යි**
**පිළිතුරට 01 යි** ( ල. 02 )

(*b*) පහත දැක්වෙන්නේ ඉපලෝගම ප්‍රදේශීය සභාව මගින් සකස් කර කලා වැව් බැම්ම මත පවත්වාගෙන යන කසල ඉවත ලන ස්ථානයකි.



ලිතුමිට, කලාවැව් බැම්ම මතින් පහත කොටුව තුළ දැක්වෙන අපද්‍රව්‍ය එකතු කරගැනීමට හැකි විය.

ඒවා කාණ්ඩ තුනකට වෙන් කර මෙම බඳුන් තුනට දැමිය යුතු ය. එසේම එම කාණ්ඩ සඳහා සුදුසු නමක් ද යෝජනා කරන්න. (කාණ්ඩ දෙකක නම් දක්වා ඇත.)

**විදුරු බෝතලය** **යෝගට් කප් එකක්**
**කපු රෙදි කැබැල්ල** **කෙසෙල් කොළ**
**ප්ලාස්ටික් බෝතලය** **කැඩුන විදුරු කොටස්**

| | | |
|---|---|---|
| ......**විදුරු බෝතලය**... | ...**යෝගට් කප් එකක්**.. | ...**කපු රෙදි කැබැල්ල**. |
| .**කැඩුන විදුරු කොටස්** | .**ප්ලාස්ටික් බෝතලය**.. | ......**කෙසෙල් කොළ**........ |
| **විදුරු** ( ල. 01 ) | **ප්ලාස්ටික්** ( ල. 01 ) | ...**දිරාපත්වන ද්‍රව්‍ය**...( ල. 02 ) **හෝ ගැලපෙන නාමයක්** |

11

07. i. එකතු කරන්න. 157 + 2384 = ......**2 541**.....

( ල. 02 )

ii. ලවන්ගි, රු. 1 000 ක නෝට්ටුවක් රැගෙන වෙළඳ පොළට ගොස් රු. 782 ක් වටිනා භාණ්ඩ මිලදී ගත්තාය. ඇයට ඉතිරිවන මුදල කොපමණ ද?

**1000 - 782 = රු. 218**

**ක්‍රමයට 01 යි**
**පිළිතුරට 01 යි** ( ල. 02 )

iii. සුළු කරන්න.

$$\begin{array}{r} 54 \\ \times\ 27 \\ \hline \mathbf{1\ 458} \\ \hline\hline \end{array}$$

( ල. 02 )

හිස්තැන් පුරවන්න.

iv. 12 × ..**1000**.. = 12 000 ( ල. 01 )

v. 57 000 ÷ 100 = ..**570**.. ( ල. 01 )

vi. පූර්ණ ලඟ නෙල්ලි ගෙඩි 140 ක් ඇත. ඔහු ඒවා සමාන ගොඩවල් තුනකට වෙන් කරයි. එවිට එක් ගොඩකට ලැබෙන ගෙඩි ගණන හා ඉතිරිවන ගෙඩි ගණන සොයන්න. (පිළිතුර ලබා ගත් ආකාරය සඳහන් කරන්න.)

**140 ÷ 3 = 46 යි ඉතිරි 2 යි**

එක් ගොඩකට ලැබෙන ගෙඩි ගණන : ....**46**....

බෙදූ පසු ඉතිරි වූ ගෙඩි ගණන : ....**2**....

( ල. 03 )

**ක්‍රමය දැක්වීමට 01 යි**
**එක් පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු 02 යි**

11

***